සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අවසාන විභාගය - 2012 ජනවාරි**

**(60) උසස් මූල්‍ය ගිණුම්කරණය**

Advanced Financial Accounting

2012-01-22
පෙරවරු
[9.00 – 12.00]

**කාලය: පැය 03 යි.**

පිටු ගණන: 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  *(1) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු ය.***
  *(2) **පෙරවැඩ සහ ගණනය කිරීම්** සියල්ල ඉදිරිපත් කරන්න. ඔබ විසින් කරනු ලබන **උපකල්පන** කිසිවක් වේ නම්, ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*
  *(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, **එක් භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*
  *(4) **ගණක යන්ත්‍ර** භාවිත කිරීමට **ඉඩ දෙනු ලැබේ.***
  *(5) ලකුණු 100.*

---

01. **සීමාසහිත සොඩියැක් පොදු සමාගමේ** 2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දී ඇත:

**2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| <u>ප්‍රකාශ කළ ප්‍රාග්ධනය</u>: | | |
| සාමාන්‍ය කොටස් (කොටස් 800,000) | | 12,000 |
| පොදු සංචිතය | | 5,330 |
| 2010 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 2,150 |
| <u>දේපල, පිරියත හා උපකරණ - පිරිවැයට</u> | | |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10,000 | |
| මෝටර් වාහන | 5,450 | |
| කාර්යාල උපකරණ | 1,450 | |
| ලී බඩු හා සවිකිරීම් | 950 | |
| <u>2010 අප්‍රේල් 01 දිනට, ක්ෂය ප්‍රතිපාදනය</u> | | |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 2,400 |
| මෝටර් වාහන | | 2,180 |
| කාර්යාල උපකරණ | | 870 |
| ලී බඩු හා සවිකිරීම් | | 665 |
| 2010 අප්‍රේල් 01 දිනට අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | | 975 |
| තොග | 3,200 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 19,800 | 7,770 |
| 14% බැංකු ණය මුදල | | 3,650 |
| මුදල් හා බැංකු ශේෂයන් | 2,250 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 34,815 | 54,950 |
| වෙනත් ආදායම් | | 345 |
| ගෙවූ ආදායම් බදු | 1,600 | |
| ගෙවූ අතුරු ලාභාංශ | 800 | |
| පරිපාලන වියදම් | 7,350 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 4,600 | |
| ණයකර පොලී | 150 | |
| වෙනත් මූල්‍ය වියදම් | 870 | |
| | **93,285** | **93,285** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත:

(1) අළුත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මුදල් සපයා ගැනීමට හිමිකම් නිකුතුවක් සහ ණයකර නිකුත් කිරීමක් 2010 ජූලි 01 දින සිදු කරන ලදී.

(i) <u>හිමිකම් නිකුතුව</u>: දැනට සිටින කොටස් හිමියන්ට ඔවුන් දරණ සෑම කොටස් 5 කටම එක්(01) කොටසක්, කොටසක් රු.13/- ක් බැගින් වූ මිලකට නිකුත් කිරීම.

(ii) <u>ණයකර නිකුතුව</u>: එකක් රු100/- ක් වූ 15% ණයකර 20,000 ක් නිකුත් කරන ලදී. ණයකර පොලී ජනවාරි 01 දින සහ ජූලි 01 දින සෑම වර්ෂයකම ගෙවිය යුතුය.

2010 ජූලි 01 දිනට හිමිකම් නිකුතුවෙන් සහ ණයකර නිකුතුවෙන් ලැබුණ මුදල්, මුදල් / බැංකු ගිණුමේ සහ පොදු සංචිතයේ පමණක් සටහන් කර ඇත. සියළුම කොටස් හිමියන් තමන්ට හිමි හිමිකම ක්‍රියාත්මක කළ බව සහ ණයකර නිකුතුව සම්පූර්ණයෙන්ම දායක (subscribed) වූ බව උපකල්පනය කරන්න.

(2) 2010 ජූලි 01 දින රු. මිලියන 7 ක් පිරිවැය වූ අළුත් යන්ත්‍රයක් සහ 2010 දෙසැම්බර් 01 දින රු.240,000/- ක පරිගණක මිලදී ගන්නා ලදී.

(3) දේපල පිරියත හා උපකරණ මත ක්ෂයවීම් පහත සඳහන් අනුපාතික යටතේ සරල මාර්ග ක්‍රමයට ප්‍රතිපාදනය කළ යුතුය:

| | | |
|---|---|---|
| පිරියත හා යන්ත්‍රෝපකරණ | - | වර්ෂයකට 10% බැගින් |
| මෝටර් වාහන | - | වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | - | වර්ෂයකට 20% බැගින් |
| ලී බඩු හා සවිකිරීම් | - | වර්ෂයකට 10% බැගින් |

(4) 2011 මාර්තු 31 දිනට උපචිත වියදම් සහ අත්තිකාරම් හා කලින් ගෙවීම් පහත සඳහන් පරිදි වේ:

| | රු. |
|---|---|
| **උපචිත වියදම්** | |
| ජලය, විදුලිය සහ දුරකථන | 41,500 |
| විකුණුම් කොමිස් | 16,500 |
| **අත්තිකාරම් හා කලින් ගෙවීම්** | |
| ප්‍රචාරණය | 85,000 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ රක්ෂණය | 36,000 |

(5) ගිණුම් පොත්වල සටහන් තැබීමේදී පහත සඳහන් වැරදි සිදුවී ඇත:

(i) ගොඩනැගිල්ලේ හිමිකරු වෙත ගෙවා ඇති රු.300,000/- ක නැවත ලබා ගත හැකි තැන්පතුවක් පරිපාලන වියදම් වලට ඇතුලත්ව තිබුණි.

(ii) මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදම් රු.32,000/- ක් විකුණුම් හා බෙදාහැරීමේ වියදම් යටතේ සටහන් කර තිබුණි.

(6) 2011 මාර්තු 31 දිනට ඇති බැංකු ණය මුදලින් 50% ක් ඊළඟ වර්ෂය තුලදී නිරවුල් කළ යුතුය.

(7) 2011 මාර්තු 30 දින රු.500,000/- ක් වටිනා භාණ්ඩ මුදල් පදනම මත මිලදී ගන්නා ලදී. කෙසේවුවද, අදාල භාණ්ඩ ව්‍යාපාරයේ ගබඩාවට ලැබී ඇත්තේ 2011 අප්‍රේල් 03 දිය.

(8) 2010/11 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු.1,800,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(9) රු.800,000/- ක ලැබිය යුතු ණයක් වර්ෂය තුලදී ලියා හැරීමට සිදුවී ඇත. වර්ෂය අවසානයේ ඇති ණයගැතියන්ගෙන් 5% ක වන සේ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් සැලසිය යුතුය.

(10) 2011 මැයි 25 දින පවත්වන ලද රැස්වීමකදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් තිරණයන්ට එළඹිණි:

- ඊළඟ වර්ෂයේදී කාර්යාල ගොඩනැගිල්ලක් මිලට ගැනීමට.
- රු.400,000/- ක් පොදු සංචිතයට මාරු කිරීමට.
- සාමාන්‍ය කොටස් හිමියන්ට එක් කොටසකට රු.2/- බැගින් වූ අවසාන ලාභාංශයක් 2011 මාර්තු 31 දිනට ඇති සාමාන්‍ය කොටස් සඳහා ගෙවීමට.

**ඔබ විසින්,** ඉහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන **සීමාසහිත සෝඩියැක් පොදු සමාගම** සඳහා, ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය:

***(මෙම ව්‍යාපාරය 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත එකී දිනට පෙර වර්ෂ වල සිට අනුගමනය කරන බව උපකල්පනය කරන්න.)***

(a) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය. (ලකුණු 10)

(b) 2011 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය. (ලකුණු 10)

(c) දේපල, පිරියත හා උපකරණ වලට සටහන්. (ලකුණු 07)

(d) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දක්වන ප්‍රකාශය. (ලකුණු 03)

(මුළු ලකුණු 30)

**02.** (A) (a) හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමට තුඩු දෙන හේතූන් හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(b) "ගානර්ට එරෙහිව මරේ රීතිය" (Garner Vs Marray Rule) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(B) **මනෝජ්, නුවන්** සහ **ජනක** ලාභ හා අලාභ 3 : 2 : 1 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2011 මාර්තු 31 දින හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට හවුල්කරුවන් තීරණය කළහ.

2011 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) පහත සඳහන් පරිදි විය.

**මනෝජ්, නුවන් සහ ජනක හවුල් ව්‍යාපාරය**
**2011 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය)**

| | රු.'000 | රු.'000 |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** (ධාරණ වටිනාකමට) | | |
| ඉඩම | 6,100 | |
| ගොඩනැගිලි | 4,650 | |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 5,925 | |
| මෝටර් රථය | 1,300 | |
| ලී බඩු | 930 | 18,905 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 634 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 720 | |
| කෙටිකාලීන ආයෝජන | 1,200 | |
| බැංකු ශේෂය | 861 | 3,415 |
| **මුළු වත්කම්** | | **22,320** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| **මනෝජ්** | 6,400 | |
| **නුවන්** | 5,600 | |
| **ජනක** | 950 | 12,950 |
| **ජංගම ගිණුම්** | | |
| **මනෝජ්** | 1,025 | |
| **නුවන්** | 1,040 | |
| **ජනක** | (2,070) | (5) |
| **වගකීම්** | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | 3,960 | |
| ණය මුදල - **මනෝජ්** | 1,300 | 5,260 |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,625 | |
| උපචිත වියදම් | 2,490 | 4,115 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **22,320** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත:

(1) **ජනක** බුන්වත්භාවයට පත්වී ඇති බැව් ප්‍රකාශ කර ඇත. **ජනකගේ** සියළුම වගකීම් **මනෝජ්** හා **නුවන්** අතර ඔවුන් අන්තිම වරට එකඟ වූ ප්‍රාග්ධන අනුපාතයට බෙදා ගැනේ.

(2) **මනෝජ්** විසින් ධාරණ අගය රු.875,000/- ක් වූ පිරියත හා යන්ත්‍රෝපකරණ රු.1,100,000/- ක අගයකට පවරා ගන්නා ලදී. **නුවන්** විසින් මොටර් රථය රු.1,350,000/- ක අගයකට පවරා ගන්නා ලදී.

(3) ඉතිරි ජංගම නොවන වත්කම් පහත සඳහන් අගයන් වලට උපලබ්ධි විය:

| | රු. |
|---|---|
| ඉඩම හා ගොඩනැගිලි | 13,390,000/- |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 5,100,000/- |
| ලී බඩු | 880,000/- |

(4) තොගයෙන් 10% ක් යල්පැන ගොස් ඇති බැව් සොයා ගන්නා ලද අතර ඉතිරි තොගය රු.590,000/- ක මිලකට විකුණන ලදී.

(5) වෙළෙඳ ලැබිය යුතු මුදල් වලින් රු.690,000/- ක් එකතු කර ගන්නා ලද අතර ඉතිරිය බොල්ණය ලෙස සැලකිය යුතුය. වෙළෙඳ ගෙවිය යුතු මුදල් සහ වෙනත් වගකීම් සම්පූර්ණයෙන් නිරවුල් කරන ලදී.

(6) **මනෝජ්** ට ඔහුගේ ණය මුදලින් කොටසක් ගෙවා දැමීම සඳහා ආයෝජන වලින් කොටසක් රු.800,000/- කට පවරා දෙන ලද අතර ඉතිරි ණය මුදල මුදලින් ගෙවීය. ඉතිරි ආයෝජන රු.695,000/- ක වෙළෙඳ අගයකට උපලබ්ධි කරගනු ලැබීය.

(7) හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමේ වියදම් රු.66,000/- ක් විය.

**ඉහත සඳහන් තොරතුරු පදනම් කරගෙන, ඔබ විසින්, හවුල් ව්‍යාපාරයේ පහත සඳහන් ගිණුම් පිළියෙල කළ යුතුය:**

(a) උපලබ්ධි ගිණුම.

(b) මුදල් පොත.

(c) හවුල්කරුවන්ගේ ජංගම සහ ප්‍රාග්ධන ගිණුම් තීරු ක්‍රමයට. (ලකුණු 14)

(මුළු ලකුණු 18)

**03.** **සීමාසහිත රන්තරු සමාගමේ** ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇති අතර ගාල්ලේ ශාඛාවක් පවත්වාගෙන යයි. 2011 මාර්තු 31 දිනට ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවේ ශේෂ පිරික්සුම් පහත සඳහන් පරිදි විය:

**2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | **ප්‍රධාන කාර්යාලය (කොළඹ)** | | **ශාඛාව (ගාල්ල)** | |
|---|---|---|---|---|
| | **හර** | **බැර** | **හර** | **බැර** |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (කොටස් 1,100,000) | - | 11,000 | - | - |
| - වරණීය කොටස් (කොටස් 230,000) | - | 2,300 | - | - |
| 2010 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | - | 6,337 | - | - |
| **ජංගම නොවන වත්කම්** (පිරිවැයට) | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 17,980 | - | 7,205 | - |
| 2011 මාර්තු 31 දිනට, **සමුච්චිත ක්ෂය** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | - | 13,282 | - | 3,950 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 14,362 | - | 7,197 | - |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | - | 4,178 | - | 877 |
| 12% දීර්ඝ කාලීන ණය | - | 1,084 | - | - |
| කෙටි කාලීන ආයෝජන | 3,100 | - | - | - |
| 2010 අප්‍රේල් 01 දිනට - තොග පිරිවැය / ඉන්වොයිස් මිලට | 1,650 | - | 174 | - |
| ගැනුම් | 10,522 | - | - | - |
| විකුණුම් | - | 18,170 | - | 9,279 |
| ශාඛාවට යැවූ භාණ්ඩ / ශාඛාව ලද භාණ්ඩ | - | 3,460 | 3,398 | - |
| ප්‍රධාන කාර්යාල ජංගම ගිණුම | - | - | - | 6,300 |
| ශාඛා ජංගම ගිණුම | 6,410 | - | - | - |
| පරිපාලන වියදම් | 3,668 | - | 1,087 | - |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 1,427 | - | 755 | - |
| මූල්‍ය වියදම් | 390 | - | - | - |
| ආයෝජන ආදායම් | - | 169 | - | - |
| තොගවල උපලබ්ධි නොවූ ලාභ සඳහා වෙන් කිරීම | - | 29 | - | - |
| බැංකු ශේෂය | 500 | - | - | - |
| අතැති මුදල් | - | - | 590 | - |
| **එකතුව** | **60,009** | **60,009** | **20,406** | **20,406** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) ශාඛාව විසින් විකුණන ලද සියළුම භාණ්ඩ පිරිවැයට 20% ක් එකතු කළ මිලකට ප්‍රධාන කාර්යාලයෙන් සපයන ලද ඒවාය.

(2) 2011 මාර්තු 31 දිනට ඉතිරි තොග පහත සඳහන් පරිදි විය:

| | <u>රු</u>. |
|---|---|
| ප්‍රධාන කාර්යාලය - පිරිවැයට | 870,000/- |
| ශාඛාව - ඉන්වොයිස් කළ මිලට | 394,000/- |

(3) ප්‍රධාන කාර්යාලයෙන් ශාඛාවට ඉන්වොයිස් කරන ලද රු.62,000/- ක භාණ්ඩ හා ශාඛාවෙන් ප්‍රධාන කාර්යාලයට යවන ලද රු.48,000/- ක මුදලක් 2011 මාර්තු 31 දිනට මාර්ගස්ථව තිබුණි.

(4) සමාගමේ ප්‍රතිපත්තිය 2011 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් වලින් 5% ක් වන සේ අඩමාන ණය සඳහා පොදු ප්‍රතිපාදනයක් කිරීමය.

(5) වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු.669,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**ඔබ විසින්, පිළියෙල කළ යුතු දෑ:**

(a) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තීරු ක්‍රමයට ප්‍රධාන කාර්යාලයේ, ශාඛාවේ සහ සමස්ථ ආයතනය සඳහා ආදායම් ප්‍රකාශය.

(b) ශාඛාවේ පොත්වල දැක්වෙන පරිදි ප්‍රධාන කාර්යාලීය ජංගම ගිණුම සහ ප්‍රධාන කාර්යාලයේ පොත්වල දැක්වෙන පරිදි ශාඛා ජංගම ගිණුම.

(c) 2011 මාර්තු 31 දිනට සමස්ථ ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය). (ලකුණු 15)

**04.** (A) "ඒකාබද්ධ අරමුදල" යන පදය පැහැදිලි කර ඒකාබද්ධ අරමුදල සමන්විත වන මුදල් වලට උදාහරණ තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 05)

(B) මහා භාණ්ඩාගාරයේ කාර්යයන් පහක්(05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

**05.** (A) මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමෙන් ලැබෙන වාසි හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 02)

(B) **සීමාසහිත ශෝබනා සමාගමේ** 2011 මාර්තු 31 දිනට සහ 2010 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් (ශේෂ පත්‍රයන්) සහ 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට ආදායම් ප්‍රකාශය පහතින් දැක්වේ:

**සීමාසහිත ශෝබනා සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය)** *(රු.'000)*

| | 2011 මාර්තු 31 දිනට | | 2010 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්**<br>**ජංගම නොවන වත්කම්**<br>**දේපල, පිරියත හා උපකරණ** | | | | |
| යන්ත්‍ර හා උපකරණ පිරිවැයට | 26,500 | | 26,500 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය වීම | (10,600) | 15,900 | (5,300) | 21,200 |
| මෝටර් වාහන පිරිවැයට | 2,000 | | 3,000 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (1,000) | 1,000 | (1,250) | 1,750 |
| ලී බඩු හා සවිකිරීම් පිරිවැයට | 1,500 | | 1,500 | |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | (450) | 1,050 | (300) | 1,200 |
| | | 17,950 | | 24,150 |
| ආයෝජන | | 2,500 | | 850 |
| | | 20,450 | | 25,000 |
| **ජංගම වත්කම්**<br>තොග | 3,897 | | 2,525 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 13,760 | | 14,000 | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 1,300 | 18,957 | 1,420 | 17,945 |
| **මුළු වත්කම්** | | **39,407** | | **42,945** |
| **ස්කන්ධය හා වගකීම්**<br>**ස්කන්ධය** | | | | |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 17,675 | | 17,675 |
| රඳවා ගත් ඉපැයීම් | | 7,027 | | 2,560 |
| | | **24,702** | | **20,235** |
| **ජංගම නොවන වගකීම්**<br>බැංකු ණය | | 5,000 | | 8,000 |
| **ජංගම වගකීම්**<br>වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 6,345 | | 10,340 | |
| උපචිත වියදම් | 1,100 | | 2,300 | |
| ගෙවිය යුතු බදු | 1,425 | | 1,520 | |
| ගෙවිය යුතු ණය පොලිය | 835 | 9,705 | 550 | 14,710 |
| **මුළු ස්කන්ධය සහ වගකීම** | | **39,407** | | **42,945** |

**සීමාසහිත ශෝබනා සමාගම**
**2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශය**

| | රු.'000 | රු.'000 |
|---|---|---|
| විකුණුම් | | 105,000 |
| විකුණුම් පිරිවැය | | (61,958) |
| **දළ ලාභය** | | **43,042** |
| **වෙනත් ආදායම්** | | |
| ආයෝජන ආදායම් | 287 | |
| මෝටර් වාහනය බැහැර කිරීමෙන් ලද ලාභය | 125 | 412 |
| | | **43,454** |
| **අඩු කළා: වියදම්** | | |
| බෙදාහැරීමේ වියදම් | 14,000 | |
| පරිපාලන වියදම් | 20,137 | |
| මූල්‍ය වියදම් | 1,650 | 35,787 |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | | 7,667 |
| බදු | | (3,200) |
| **බදු වලට පසු ශුද්ධ ලාභය** | | **4,467** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) සමාගම 2007 අප්‍රේල් 01 දින රු. 1,000,000/- කට මිලදී ගනු ලැබූ මෝටර් වාහනයක් 2010 අප්‍රේල් 01 දින බැහැර කරන ලදී. මොටර් වාහන සඳහා ක්ෂය කිරීමේ අනුපාතය සරල මාර්ග ක්‍රමය මත වර්ෂයකට 25% කි.

(2) වර්ෂය සඳහා ක්ෂය වීම රු.5,950,000/- කි.

(3) සමාගම වර්ෂය තුළදී රු.1,650,000/- ක් වර්ෂ 5 ක් සඳහා වන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කරන ලදී.

**ඔබ විසින්,** සෘජු ක්‍රමය භාවිත කර **සීමාසහිත ශෝබනා සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. (ලකුණු 15)
(මුළු ලකුණු 17)

**06.** (A) ව්‍යාපාරික තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ගිණුම්කරණ අනුපාත භාවිත කිරීමේදී ඇති සීමාවන් තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

(B) ලාභදායිත්ව අනුපාත තුනක්(03) සහ ආයෝජන අනුපාත තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

(C) **සීමාසහිත මිකී ලීසිං පොදු සමාගම** 2010 අප්‍රේල් 01 දින යන්ත්‍රයක් කල්බදු පදනම මත මිලදී ගැනීම සඳහා **සීමාසහිත ඩොනල්ඩ් සමාගමට** මූල්‍ය කල්බදු පහසුකමක් සපයන ලදී. කල්බදු ගිවිසුමේ කොන්දේසි පහත සඳහන් වේ:

| | |
|---|---|
| යන්ත්‍රයේ පිරිවැය | රු.3,250,000/- කි. |
| කල්බදු කාල සීමාව | වර්ෂ 5 කි. |
| මූලික තැන්පතුව | රු.650,000/- කි. |
| වාර්ෂික වාරිකයක වටිනාකම | රු.869,362/- කි. (වර්ෂය අගදී ගෙවිය යුතුය) |
| පොලී අනුපාතය | වර්ෂයකට 20% කි. |

**ඔබ විසින්,** 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඉහත සඳහන් ගනුදෙනු **සීමාසහිත ඩොනල්ඩ් සමාගමේ** පොත්වල වාර්තා කිරීම සඳහා අවශ්‍යවන ගිණුම් සටහන් ඉදිරිපත් කළ යුතුය. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

- o0o -